# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ

**පුද්ගලයන් පොලිස් අත්අඩංගුවේ පසුවන අවස්ථාවකදී හා පොලීසිය සමඟ සිදුවන ගැටුමකදී සිදුවන මරණ වළක්වා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා පොලිසිය වෙත යොමු කරනු ලබන 2025 අංක 01 දරන පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ**

**2025 මැයි**

## හැඳින්වීම

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති ජීවත්වීමේ නෛසර්ගික අයිතිය ශ්‍රී ලංකාවේ සෑම පුද්ගලයෙකුටම හිමිවේ. ශ්‍රියානි සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ, ස්ථාන භාර නිලධාරී, පයාගල පොලිසිය [2003] 1 ශ්‍රී.එල්.ආර්. 14 නඩුවේදී මෙන්ම වඩාත් මෑතක දී ෆාතිමා ෂර්මිලා එදිරිව ස්ථාන භාර නිලධාරී, කොම්පඤ්ඤවීදිය පොලිසිය සහ තවත් අය, අංක 398/2008 දරන ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් පෙත්සම සම්බන්ධ නඩුවේදී විද්‍යාමානවූ පරිදි එකී ජීවත්වීමේ අයිතිය නැවත නැවතත් නීති විද්‍යාව තුළ තහවුරු කර ඇත.

"ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වූ ෆාතිමා ෂර්මිලා නඩුවේදි නිරීක්ෂණය වි ඇති ආකාරයට " නීතියට පරිබාහිරව සිදුවන ඝාතන හෝ අත්අඩංගුවේදී සිදු වන මරණ වැලැක්වීම තුළින් ජීවත්වීමේ අයිතිය උල්ලංඝනය නොවීම ඇතුළු මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අදාළ ජාත්‍යන්තර වගකීම් සපුරාලීමට හැකිවන පරිදි දේශීය නීති සම්මිතයන් ඉහළ නැංවීමට හැකියාව ලැබේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාව පුළුල් ලෙස අර්ථ නිරූපණය කළ යුතු අතර විශේෂයෙන්ම පොලිසිය ඇතුළුව රජයේ සියලුම ආයතනයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඈ) ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ රාජ්‍ය වගකීම සැලකිල්ලට ගනිමින්, එකී ව්‍යවස්ථාවේ සඳහන් පරිදි සහ පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් වලට "ගෞරව කිරීම, සුරක්ෂිත කිරීම සහ ඉහළ නැංවීමට කටයුතු යුතු අතර එම අයිතිවාසිකම් "සංෂිප්ත කිරීම, සීමා කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම" නොකිරීමට වග බලා ගත යුතු ය.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 6 වන වගන්තිය ප්‍රකාරව සෑම මිනිසෙකුටම ජීවත්වීමේ සහජ අයිතියක් ඇත. මෙම අයිතිය නීතියෙන් ආරක්ෂා කළ යුතු අතර කිසිවෙකුගේ ජිවිතය අත්තනෝමතිකව අහිමි කිරීම නොකළ යුතු ය.

ඒ අනුව, ශ්‍රී ලංකා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන රඳවා සිටින සියලුම තැනැත්තන්ටද ඔවුන්ගේ නෛසර්ගික ජීවත්වීමේ අයිතියට ගෞරවය හා ආරක්ෂාව හිමි වේ.

'පොලිස් අත්අඩංගුව' යන්නෙන් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ යම් අධිකරණයකට ඉදිරිපත් කිරීමට පෙර පොලීසිය විසින් භාරයේ තබා ගැනීමේ තත්ත්වයයි. නීතියේ දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුව පොලීසිය විසින් යම් තැනැත්තෙකු පොලිස් භාරයට ගත් අවස්ථාවේ සිට නීත්‍යානුකූලව ඔහු පොලිස් අත්අඩංගුවෙන් මුදා හරින තෙක් හෝ අධිකරණයට ඉදිරිපත් කරන තෙක් එම තැනැත්තා පොලිස් අත්අඩංගුවේ පසුවන තැනැත්තෙක් වේ.

'පොලිස් භාරයේ සිදුවන මරණය' යන්නෙන් අදහස් කරන්නේ පොලිස් නිලධාරියකු/නිලධාරීන්ගේ ඍජු හෝ වක්‍ර ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් පොලිසීය භාරයේ සිටින පුද්ගලයකු මිය යාමයි. එවැනි මරණයක් සිදුවිය හැක්කේ:

අ) අත්අඩංගුවට ගත් ස්ථානයේ සිට පොලිස් රැඳවුම් ස්ථානයකට හෝ පොලිස් ස්ථානයකට රැගෙනයාමේදී;

ආ) පොලිස් රැඳවුම් ස්ථානයක හෝ පොලිස් ස්ථානයක රඳවා තබා සිටියදී; හෝ

ඇ) රැඳවුම් ස්ථානයක හෝ පොලිස් ස්ථානයක සිට වෙනත් බලයලත් ස්ථානයකට (උදා: රෝහලකට) රැගෙනයාමේදී , විමර්ශන කටයුත්තක් හෝ අතරතුර දී ය.

'පොලීසිය සමඟ සිදුවන ගැටුමකදී සිදුවන මරණයක්' යන්නෙන් අදහස් කරන්නේ පොලිස් නිලධාරියෙකු/ නිලධාරීන් විසින් කවර හෝ නීතිමය රාමුවකින් බැහැරව අධිකරණ පද්ධතියට පරිබාහිරව සිදු කරන ඝාතනයන්ය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි සහ ඒ පිළිබඳව සිදුකරන ලද විමර්ශන මත පදනම්ව, 2020 ජනවාරි සිට 2025 මාර්තු 31 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධව

අත්අඩංගුවේදී මරණ හතළිස් නවයක් සහ පොලසිය සමඟ සිදුවන ගැටුමකදී සිදුවන මරණ තිහක් නිරීක්ෂණය වී ඇත.

මෙම කාල වකවානුව තුළ, වාර්තාවූ  අත්අඩංගුවේදී සිටියදී සිදුවූ මියයාම් වැඩි ප්‍රමාණයක් කොළඹ, ගම්පහ සහ කළුතර යන ප්‍රධාන දිස්ත්‍රික්ක තුන තුළ පිහිටි පොලිස් ස්ථාන හෝ කොට්ඨාස ආශ්‍රිතව සිදුවූ ඒවා විය. ශ්‍රී ලංකා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති බහුතර වින්දිතයෝ අත්අඩංගුවට ගත් මොහොතේ සිට පැය 24කට අඩු කාලයකදී වින්දිතයෝ සිදුවූ තුවාල හේතුවෙන් මිය ගිය බව වාර්තා වී ඇත. වාර්තා වී ඇති බොහෝ මරණ සිදු වී ඇත්තේ අවි ආයුධ හෝ මත්ද්‍රව්‍ය  ඇති ස්ථාන පෙන්වීමට යාමේ ක්‍රියාවලියේදී, හෝ කුරිරු, අමානුෂික, අවමන් සහගත සැලකීම් නිසා හෝ රාජකාරියේ යෙදී සිටින නිලධාරීන්ගේ නොසැලකිල්ල හෝ අතපසුවීම හේතුවෙන් බව ද නිරීක්ෂණය වී ඇත.

කොමිෂන් සභාවට වාර්තා වූ පොලීසිය සමඟ සිදුවන ගැටුම් වලදී සිදුවූ මරණ වලින් වැඩි ප්‍රමාණයක් ද කොළඹ, ගම්පහ සහ ගාල්ල දිස්ත්‍රික්කවල පොලිස් ස්ථාන හෝ කොට්ඨාසවලට සම්බන්ධ ඒවා වේ. කොළඹින් වාර්තාවූ සිදුවීම් තුනක් විශේෂ කාර්ය බළකායට සම්බන්ධ වූ සිදුවීම් විය. පොලීසිය සමඟ ගැටුම් වලදී සිදුවූ බොහෝ මරණ සිදුවී ඇත්තේ අත්අඩංගුවට ගැනීමකදී හෝ පොලීසිය පවසන ආකාරයට ප්‍රචණ්ඩකාරී හැසිරීම් සහිත පුද්ගලයන් සමඟ ගනුදෙනු කිරීමේදී ආත්මාරක්ෂාව සඳහා ඇති සිය අයිතිය ක්‍රියාත්මක කිරීමේදී ය.

මෙම පසුබිම තුළ, පොලිස් භාරයේදී හා පොලීසිය සමඟ සිදුවන ගැටුමකදී සිදුවූ මරණ වළක්වාගැනීමත්, සියලු පුද්ගලයන් සතු ජීවත්වීමේ නෛසර්ගික අයිතිය සුරක්ෂිත කිරීමත් උදෙසා ශ්‍රී ලංකා පොලිසිය වෙත පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ නිකුත් කළ යුතු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අදහස විය. තවද මෙම පොදු මාරගෝපදේශ හා නිර්දේශ නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිසිය විසින් නිකුත් කර ඇති අදාල දෙපාර්තමේන්තු නියෝගවල සඳහන් කරණු තවදුරටත් ශක්තිමත් කිරීම හා විධිමත්ව ක්‍රියාත්මක කිරීමේ අරමුණ සඳහාය.

## 1. අත්අඩංගුවට ගැනීමට පෙර, අතරතුර සහ අත්අඩංගුවට ගැනීමෙන් පසු ආරක්ෂාව

***සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමට සූදානම් වීම***

1.1 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව ප්‍රකාර අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටීමට සෑම පුද්ගලයෙකුටම ඇති අයිතිය පොලිස් නිලධාරීන් ගරු කළ යුතු ය.

1.2 අත්අඩංගුවට ගැනීම් අත්තනෝමතිකව සිදු නොකළ යුතු ය. යම් පුද්ගලයෙකු අත් අඩංගුවට ගන්නා සෑම පොලිස් නිලධාරියෙකුටම එම පුද්ගලයා වරදක් කර ඇති බවට ඇති සාධාරණ සැකය මත එසේ අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාව මූලික පොලිස් විමර්ශනයකින් අනතුරුව සාධාරණීකරණය කිරීමට හැකි විය යුත්තේය.

1.3 අත්අඩංගුවට ගැනීමට පෙර මූලික විමර්ශන පැවැත්විය යුතු ය. එය යම් පුද්ගලයෙකු වරදක් සිදු කරන ස්ථානයක දී හෝ වරදක් කිරීමට තැත් කරන ස්ථානයක දී හෝ වරදක් සිදුකිරීමක් හෝ වරදක් සිදුකිරීමට තැත් කිරීමක් සම්බන්ධයෙන් කිසියම් තොරතුරක් හෝ බුද්ධි තොරතුරක් ලද පොලිස් ස්ථානයේදී හෝ සිදු විය හැක.

1.4 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(5) ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති පරිදි වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝෂී යැයි පූර්වනිගමනය කළ යුත්තේ යන  මූලික අයිතිවාසිකමට පොලිස් නිලධාරීන් ගරු කළ යුතු ය. මූලික විමර්ශනවලදී, සියලු සැකකරුවන්ට අපරාධ පාපොච්ඡාරණයක් නොකිරීමට ඇති අයිතිය ලබා දිය යුතු ය. ඕනෑම සැකකරුවෙකුට නිශ්ශබ්දව සිටීමටත්, කිසිදු තත්ත්වයක් යටතේ අපරාධපාපොච්ඡාරණයක් සිදු නොකර සිටීමේ සැකකරුවෙකුට ඇති අයිතියට පොලිස් නිලධාරීන් ගරු කළ යුතු යුතු ය.

1.5 මූලික විමර්ශනයකදී, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109 වැනි වගන්තිය ප්‍රකාරව පොලිසියට ප්‍රකාශයක් ලබාදීමට කැඳවීමෙන් පසු යම් පුද්ගලයකුට ස්වයං පාපොච්ඡාරණයක් මත ප්‍රකාශයක් කිරීමට බල කරනු ලබන විටකදී එකී බල කිරීම මත කරනු ලබන ප්‍රකාශ මත අත්අඩංගුවට ගැනීම නොකළ යුතු ය. ප්‍රකාශයක් ලබා දීම සඳහා පුද්ගලයෙකු කැඳවීමේදී, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 110(2) වගන්තිය යටතේ තහවුරු කර ඇති එම පුද්ගලයා සතු අයිතිවාසිකම්වලට පොලිසිය සෑම විටම ගරු කළ යුතු ය:

> ***තමා අපරාධ චෝදනාවකට හෝ දණ්ඩනයකට හෝ රාජ්‍ය සන්තක කිරීමකට භාජන කිරීමේ නැඹුරුතාවක් ඇති ප්‍රශ්න හැර, ඒ කාරණයට අදාළව ඒ නිලධාරියා හෝ පරීක්ෂකවරයා විසින් තමාගෙන් අසනු ලබන සියලු ප්‍රශ්නවලට සත්‍ය පිළිතුරු දීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය .***

1.6 සාපරාධී ක්‍රියාකාරකම් හෝ බරපතල සාපරාධී වරදක් කිරීමට තැත් කිරීම් සම්බන්ධයෙන් පොලීසියට තොරතුරු හෝ බුද්ධි තොරතුරු ලැබෙන්නේ නම්, එවැනි තොරතුරු හෝ බුද්ධි තොරතුරු සාක්කු සටහන් පොතේ (PNB) ලිඛිතව සටහන් කළ යුතු ය. එවැනි තොරතුරු හෝ බුද්ධි තොරතුරු ලබා දුන්නේ ඉහළ අධිකාරියක් විසින් නම්, එවැනි පුද්ගලයෙකුගේ විස්තර ද වාර්තා කළ යුතු ය. එවැනි වාර්තාවක් අත් අඩංගුවට ගැනීම සඳහා පදනම ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා අතිශය වැදගත් වේ.

1.7 සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් නිලධාරීන් යෙදවීම භාර ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා විසින් සැකකරු අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියේදී පොලීසියට ඇතිවිය හැකි අවදානම් සහ අභියෝග තක්සේරු කළ යුතු ය.

1.8 තක්සේරු කරන ලද අවදානම් මට්ටම මත ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියාට පහත පරිදි තීරණය කළ හැක:

අ) අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමේදී යෙදවිය යුතු පොලිස් නිලධාරීන්ගේ සංයුතිය සහ සංඛ්‍යාව;

ආ) මෙහෙයුම සඳහා යෙදවිය යුතු වාහන වර්ගය සහ සංඛ්‍යාව;

ඇ) අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමේදී පොලිස් නිලධාරීන් සන්නද්ධ කළ හැකි බලයලත් පාලන ක්‍රම සහ ආයුධ;

ඈ) මෙහෙයුම අතරතුර කණ්ඩායම අනුගමනය කළ යුතු අණ දාමය; සහ

ඉ) මෙහෙයුම දියත් කරන දිනය, ස්ථානය හා වේලාව.

1.9 සැකකාරියක් අත්අඩංගුවට ගැනීමකදී අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමට සම්බන්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමේ සංයුතියට අවම වශයෙන් එක් කාන්තා නිලධාරිනියකවත් ඇතුළත් විය යුතු ය.

1.10 අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුම සඳහා යොදවනු ලබන සියලුම පොලිස් නිලධාරීන්, මෙහෙයුමේ විෂය පථය සහ අරමුණ, ඔවුන්ගේ නිශ්චිත භූමිකාවන් සහ මෙහෙයුමට සම්බන්ධ අවදානම් සහ අභියෝග පිළිබඳව සවිස්තරාත්මකව දැනුවත් කළ යුතු ය.

1.11 අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුම පිළිබඳ දැනුමක් ඇති සියලුම පොලිස් නිලධාරීන් මෙහෙයුම සම්බන්ධයෙන් මෙන්ම සැකකරුගේ විස්තර සහ ස්ථාන සම්බන්ධයෙන් පොලිසියට ලැබෙන වෙනත් තොරතුරු සැකකරුට අගතියක් නොවන පරිදි අනාවරණය නොවන ලෙස කටයුතු කළ යුතු ය.

***සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම***

1.12 අත්අඩංගුවට ගැනීමක් සිදු කරන සියලුම පොලිස් නිලධාරීන් තම අනන්‍යතාව සෑම විටම නිවැරදිව, දෘශ්‍යමානව සහ පැහැදිලිව ඔවුන්ගේ නිල ඇඳුමේ ප්‍රදර්ශනය කළ යුතු ය.

1.13 විශේෂ අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමක් සඳහා නිලධාරීන් සිවිල් ඇඳුමින් සිටිය යුතු නම්, ඕනෑම අවස්ථාවක තම අනන්‍යතාව සනාථ කිරීම සඳහා නිලධාරීන් සතුව ඔවුන්ගේ නිල හැඳුනුම්පත් තිබිය යුතු ය. අත්අඩංගුවට ගැනීමේදී සිවිල් ඇඳුමින් සැරසී සිටින නිලධාරීන් තම නිල හැඳුනුම්පත් ප්‍රදර්ශනය කළ යුතු අතර අත්අඩංගුවට ගන්නා පුද්ගලයාට තම නිල අනන්‍යතාව දැනුම් දිය යුතු ය.

1.14 පොදුවේ ගත් කල අත්අඩංගුවට ගැනීමේදී බලය භාවිත නොකළ යුතු ය. අත්අඩංගුවට ගන්නා තැනැත්තෙකු ප්‍රතිරෝධයක් දක්වන අවස්ථාවකදී, අත්අඩංගුවට ගැනීම සඳහා ඕනෑම බලයක් භාවිත කළ යුත්තේ එය අවශ්‍ය සහ ප්‍රමාණානුකූල වන ආකාරයට සහ අදාළ තැනැත්තාට අවම හානියක් වන ආකාරයට පමණි.

1.15 අත්අඩංගුවට ගන්නා නිලධාරීන් විසින් තැනැත්තෙකු අත් අඩංගුවට ගන්නා අවස්ථාවේදී, එම තැනැත්තා අත්අඩංගුවට ගනු ලබන වරද සම්බන්ධයෙන් පැහැදිලිවම එම තැනැත්තාට දැනුම් දිය යුතු ය. එවැනි දැනුම්වත් කිරීමක් අත්අඩංගුවට ගනුලබන තැනැත්තාට සන්නිවේදනය කළ හැකි භාෂාවකින් සිදුකළ යුතු ය.

1.16 තවද සැලකිලිමත් විය යුත්තේ 1997 අංක 30 දරණ ඇප පනත යටතේ ඇප ලබාදීම සම්මතය ලෙස සැලකිය යුතු බව හා සැකකරුවෙකු රිමාන්ඩ් භාරයට පත් කිරීම ව්‍යතිරේකයක් විය යුතු බවයි.

1.17 අත්අඩංගුවට ගැනීමක් සිදු කරන පොලිස් නිලධාරීන් සමස්ත ක්‍රියාවලිය තුළම අත්අඩංගුවට ගත් තැනැත්තාගේ අභිමානයට ගරු කළ යුතු ය. අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ අනන්‍යතාවය අනාවරණය වන ආකාරයට ක්‍රියා කිරීම හෝ අත්අඩංගුවට ගත් පුද්ගලයාට කිසිඳු තත්ත්වයක් යටතේ අවමන් සහගත ලෙස සැලකීමෙන් පොලිස් නිලධාරීන් වැළකී සිටිය යුතු ය.

1.18 කිසියම් පොලිස් නිලධාරියෙක් හෝ කණ්ඩායමක් විසින් නියමිත රාජකාරි ප්‍රදේශය හැර වෙනත් පොලිස් බල ප්‍රදේශයක අත්අඩංගුවට ගැනීමක් සිදු කරන්නේ නම්, එවැනි අත්අඩංගුවට ගැනීමක් කරන පොලිස් නිලධාරීන් අත්අඩංගුවට ගැනීම සිදු කළ ප්‍රදේශයේ පොලිස් ස්ථානයට එම අත්අඩංගුවට ගැනීම දැනුම් දිය යුතු අතර අත්අඩංගුවට ගැනීම පිළිබඳව හා අදාල සැකකරු සම්බන්ධව තොරතුරු අදාළ පොලිස් ස්ථානයේ ලිඛිතව සටහන් කර ඇති බවට වග බලා ගත යුතු ය.

***අත්අඩංගුවට ගත් සැකකරුවෙකු රඳවා තබා ගැනීම***

1.19 අත්අඩංගුවට ගත් විගස, අත්අඩංගුවට ගත් සැකකරු රඳවා තබාගන්නේ නම් ආරක්ෂිතව අදාළ පොලිස් ස්ථානයට හෝ වෙනත් රැඳවුම් ස්ථානයක් ලෙස ගැසට් කරන ලද ස්ථානයකට ගෙන යා යුතු ය.

1.20 අත්අඩංගුවට ගත් තැනැත්තෙකු රඳවා ගැනීමට පෙර, අත්අඩංගුවට ගැනීම පිළිබඳ විස්තර නිසි ලෙස සටහන් කළ යුතු අතර, එම කාලය තුළ සැකකරුගෙන් ලබාගත් ඕනෑම ප්‍රකාශයක්,සැකකරුට පහසුවෙන් සන්නිවේදනය කරගත හැකි භාෂාවකින් දැනුම්වත් කළ යුතු ය.

1.21 අත්අඩංගුවට ගත් තැනැත්තෙකු සෝදිසි කරන පොලිස් නිලධාරීන් එම පුද්ගලයාගේ අභිමානයට සහ පෞද්ගලිකත්වයට හානි නොවන අයුරින් එවැනි සෝදිසි කිරීම් සිදු කළ යුතු ය. අත්අඩංගුවට ගනු ලබන කාන්තාවක් පිළිබඳ සෝදිසි කිරීමක් සිදු කළ යුත්තේ කාන්තා පොලිස්

නිලධාරිනියක් විසින් පමණක්ම වන අතර එම තැනැත්තියගේ ගෞරවය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා වන ආකාරයෙන් එම සොදිසි කිරීම කළ යුතු ය.

***බාහිර පාර්ශව සමඟ සන්නිවේදනය කිරීම***

1.22 අත්අඩංගුවට ගත් තැනැත්තා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඔහු විසින් දැනුම් දෙනු ලබන තම පවුලේ අය හෝ තමන් කැමති මිතුරෙකු සමඟ සන්නිවේදනය කිරීමට වහාම අවස්ථාව ලබා දිය යුතු ය. 2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ 15(2) වගන්තියෙන් එම අයිතිය සහතික කර ඇත. ඒ අනුව අත් අඩංගුවට ගත් තැනැත්තාට තමා අත්අඩංගුවට ගැනීමට හේතුව, අත්අඩංගුවට ගැනීම සිදු කළ පොලිස් ස්ථානය සහ රඳවා සිටින ස්ථානය සන්නිවේදනය කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.

1.23 අත් අඩංගුවට ගත් තැනැත්තා මුල් රැඳවුම් ස්ථානයේ සිට වෙනත් ස්ථානයකට රැගෙන ගියහොත්, ස්ථානය වෙනස් කිරීමට හේතුව ඇතුළුව, රඳවා තබා ගැනීමේ ස්ථානය වෙනස් කිරීම සම්බන්ධයෙන් ඉහත අංක 1.22 සඳහන් පාර්ශවයන් වෙත දැනුම්වත් කළ යුතු ය.

1.24 අත්අඩංගුවට ගත් තැනැත්තෙකු භාරව සිටින පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට පත් තැනැත්තා සම්බන්ධයෙන් සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු එම තැනැත්තාගේ අදාළ පවුලේ සාමාජිකයෙකුට හෝ මිතුරෙකුට ලබා දිය යුතු ය. එවැනි තොරතුරු කඩිනමින් ආචාරශීලිව සහ අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සැපයිය යුතු ය. එවැනි නිලධාරීන් එම තොරතුරු ලබා දුන් වේලාව, එම තොරතුරු ලබා ගන්නා තැනැත්තාගේ නම සහ එවැනි තැනැත්තෙකුට ලබා දුන් තොරතුරුවල ස්වභාවය ඇතුළුව, එවැනි තොරතුරු සැපයීම පිළිබඳ ලිඛිතව අදාළ පොලිස් ස්ථානයේ සටහන් තැබිය යුතු ය.

***නීතිමය උපදෙස් සඳහා ප්‍රවේශය***

1.25 අත්අඩංගුවට ගැනීමක් සිදු කරන පොලිස් නිලධාරියා විසින් අත්අඩංගුවට ගත් තැනැත්තාට නීතිඥ නියෝජනය සඳහා ඇති අයිතිය පිළිබඳව දැනුවත් කළ යුතු ය.

1.26 බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ15(2) වගන්තිය ප්‍රකාරව අත්අඩංගුවට ගත් තැනැත්තාට කිසිදු ප්‍රමාදයකින් හෝ බාධාවකින් තොරව තමන් කැමති නීතිඥවරයෙකු සමඟ සන්නිවේදනය කිරීමට අවස්ථාව ලබා දිය යුතුව ඇත.

1.27 අත්අඩංගුවට ගත් තැනැත්තෙකු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයාට ප්‍රමාදයකින් හෝ බාධාවකින් තොරව රැඳවුම් ස්ථානයේදී එකී තැනැත්තා වෙත ප්‍රවේශ වීමට අවසර දිය යුතු ය. එවැනි නීතිඥයෙකුට තම සේවාදායකයා සමඟ සන්නිවේදනය කිරීමට ප්‍රමාණවත් කාලයක් සහ පෞද්ගලිකත්වයක් ලබා දිය යුතු ය.

## 2. රැඳවුම් කාලය තුළ ආරක්ෂාව

***ප්‍රමාණවත් වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම***

2.1 රැඳවියෙකු පොලිස් අත්අඩංගුවේ රඳවා තබාගෙන සිටින අවස්ථාවේ දී එකී රැඳවියා භාරව සිටින පොලිස් නිලධාරියා විසින් වෛද්‍ය ප්‍රතිකාර හෝ නිශ්චිත ඖෂධ අවශ්‍ය වේද යන්න හා ඔහු දැනටමත් රෝගයක් සඳහා ප්‍රතිකාර ලබා ගන්නේ ද යන්න සොයා බැලිය යුතු එවැනි වෛද්‍ය

ප්‍රතිකාර හෝ ඖෂධ කායික හෝ මානසික රෝගයක් හෝ තත්ත්වයක් සඳහා විය හැකි අතර ඒ අනුව සුදුසු පියවර ගත යුතු ය.

2.2 රැඳවියෙකුට වෛද්‍ය ප්‍රතිකාර හෝ විශේෂිත ඖෂධ ලබා ගැනීමේ අවශ්‍යතාවක් පිළිබඳව පොලිස් නිලධාරියා දැනුවත් වුවහොත්, පොලිස් නිලධාරියා විසින් වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා රැඳවියා වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කළ යුතු ය. එවැනි වෛද්‍ය පරීක්‍ෂාවක අරමුණ වන්නේ අවශ්‍ය වෛද්‍ය ආධාර සැපයීමයි.

2.3 වෛද්‍ය නිලධාරියා, රැඳවියා පරීක්ෂා කිරීමේදී, යම් තුවාලයක්, රෝගාබාධයක් හෝ වෙනත් රෝගී තත්ත්වයක් නිරීක්ෂණය කළහොත්, එම නිලධාරියා විසින් සැකකරු විගස අධිකරණ වෛද්‍ය නිලධාරියකු (JMO) වෙත යොමු කළ යුතු ය.

2.4 සියදිවි නසාගැනීමේ අවදානමක් නිරීක්ෂණය වුවහොත්, රැඳවියා භාරව සිටින පොලිස් නිලධාරියා විසින් රැඳවියාගේ පවුලේ අය හා සුදුසු වෛද්‍ය වෘත්තිකයෙකු සම්බන්ධ කර ගත යුතු ය. සියදිවි නසාගැනීමේ ඉහළ අවදානමක් ඇති රැඳවියන් සමීපව නිරීක්ෂණය කිරීමට අවශ්‍ය මනෝවිද්‍යාත්මක සහය ලබා ගැනීමට පහසුකම් සැලසීමට හැකිවන පරිදි රඳවා තබා ගැනීමේ තත්ත්වයන් හැකි සෑම අවස්ථාවකදීම ලබා දිය යුතු ය.

2.5 රඳවා තබාගෙන සිටින අතරතුර ඕනෑම අවස්ථාවක රැඳවියා විසින් ඉල්ලීමක් කරන්නේ නම්, වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අවස්ථාව රැඳවියාට සලසා දිය යුතු ය. අත්අඩංගුව භාර පොලිස් නිලධාරීන් විසින් රැඳවියාගේ අවශ්‍යතා ප්‍රථමයෙන් තහවුරු කර නොගෙන රැඳවියාගේ එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

2.6 ප්‍රථමාධාර පිළිබඳ මූලික දැනුමකින් සහ රැඳවියන්ගේ වෛද්‍ය අවශ්‍යතා කඩිනමින් සපුරාලීමේ ප්‍රමාණවත් ලෙස පුහුණු වූ අවම වශයෙන් එක් පොලිස් නිලධාරියෙක් හෝ පොලිස් ස්ථානයේ සෑම විටම සිටිය යුතු ය.

2.7 විශේෂිත අවශ්‍යතා සහිත රැඳවියන්ට, ඔවුන් සතු වෛද්‍ය සංකූලතාවන්ට හෝ තත්ත්වයන්ට අනුකූලව විශේෂ වෛද්‍ය ප්‍රතිකාර සහ රැකවරණය ලබා දිය යුතු ය. එවැනි තැනැත්තන් ලෙස ආබාධ සහිත පුද්ගලයින්, ගර්භනී මව්වරුන්, කිරි දෙන මව්වරුන් සහ ශාරීරික හෝ මානසික සෞඛ්‍ය ගැටලු ඇති තැනැත්තන් ද විය හැකි ය.

2.8 යම් නිශ්චිත රැඳවියෙකු සඳහා රැඳවුම් ස්ථානයක තබා ඇති ඕනෑම ඖෂධයක් රැඳවියාගේ නම සහ නියමිත මාත්‍රාව සහ ගතයුතු වාර ගණන සමඟ පැහැදිලිව ලේබල් කර තැබිය යුතු ය.

2.9 ප්‍රථමාධාර ද්‍රව්‍ය ඇතුළු සියලුම ඖෂධ රැඳවියන්ට ප්‍රවේශ විය නොහැකි ලෙස අගුලු දමා වෙන වෙනම ගබඩා කළ යුතු අතර රැඳවියෙකුට ඖෂධ ලබාදිය යුත්තේ බලයලත් පොලිස් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ පමණි.

***මූලික අවශ්‍යතා සැපයීම***

2.10 රැඳවියන්ට අවශ්‍ය අවස්ථාවලදී නිසි පරිදි පිරිසිදු පානීය ජලය සැපයිය යුතු ය.රැඳවියන් රඳවා තබා ගැනීමේ කාලසීමාව අනුව අවශ්‍ය වන පරිදි ප්‍රමාණවත් ආහාර වේල් ලබා දිය යුතු ය.

2.11 රැඳවියන්ට අවශ්‍ය පරිදි සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රවේශය ලබා දිය යුතු අතර එම පහසුකම් භාවිතා කරන අවස්ථාවන්හිදී පොලිස් නිලධාරියෙකු ඔවුන් සමඟ යා යුතු ය. කාන්තා රැඳවියන් සමඟ යා යුත්තේ කාන්තා පොලිස් නිලධාරිනියකි. සියලුම සනීපාරක්ෂක පහසුකම් පිරිසිදු, සෞඛ්‍ය ආරක්ෂිත භාවිතයට සුදුසු පරිදි විය යුතු ය. කාන්තා රැඳවියන්ගේ සනීපාරක්ෂක අවශ්‍යතා හා සියලු පහසුකම් රැඳවියාගේ සමාජභාවයට ගැලපෙන ලෙස සපුරාලිය යුතු ය.

2.12 රැඳවියා සනීපාරක්ෂක පහසුකම් සලසා ගැනීමට යම් ස්ථානයකට ඇතුළු වීමට පෙර, රැඳවියා විසින් තමාට යම් ස්වයං හානියක් සිදු කරගත හැකි කවර හෝ ආකාරයේ ද්‍රව්‍ය, උපකරණ හෝ

මෙවලම් එම පහසුකම තුළ නොමැති බවට රැඳවියා සමඟ සිටින පොලිස් නිලධාරියා තහවුරු කරගත යුතු ය.

*අධීක්ෂණය සහ සන්නිවේදනය*

2.13 රාජකාරියේ යෙදී සිටින සහ රැඳවියන්ගේ අත්අඩංගුව භාරව සිටින පොලිස් නිලධාරීන් විසින් සෑම රැඳවියෙකුගේම හැසිරීම් සහ චර්යාවන් නිරීක්ෂණය කළ යුතු ය. එවැනි නිලධාරීන් විසින් රැඳවියන් අතර ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීමේ කිසියම් සම්භාවිතාවක් ඇත්නම් එය හඳුනාගෙන රඳවා තබා ගැනීම් අතරතුර සිදුවිය හැකි ප්‍රචණ්ඩ ක්‍රියා හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම වැළැක්වීමට කඩිනම් පියවර ගත යුතු ය.

2.14 රැඳවියන් අතර ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් හටගත් අවස්ථාවකදී අදාළ පොලිස් නිලධාරීන් ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතු අතර අවශ්‍ය පරිදි ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සම්බන්ධවූ රැඳවියන් වෙන් වෙන්ව වශයෙන් රඳවා තබා ගැනීමට ක්‍රියා කළ යුතු ය.

## 3. විමර්ශන වලදී ආරක්ෂාව

*මූලික පරීක්ෂණ පැවැත්වීම*

3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති පරිදි, විමර්ශන ක්‍රියාවලියේදී වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට ලක් කිරීමෙන් නිදහස් වීමට අත්අඩංගුවට පත් සියලු තැනැත්තන්ට සහ රැඳවියන්ට ඇති අයිතියට පොලිස් නිලධාරීන් ගරු කළ යුතු ය.

3.2 සියලුම සැකකරුවනගෙන් ප්‍රශ්න කිරීම් නීත්‍යානුකූල සහ නිසි ලෙස බලයලත්, පැහැදිලිව හඳුනාගත හැකි සහ ප්‍රවේශ විය හැකි ස්ථානයක සිදු කරන බවට පොලිස් නිලධාරීන් සහතික විය යුතු ය.

3.3 විමර්ශනයක ස්වභාවය අනුව රැඳවියා පොලිස් ස්ථානයෙන් පිටතට ගෙන යාමට අවශ්‍ය වන විශේෂ අවස්ථාවන්හිදී හැර, පොලිස් ස්ථානයෙන් පිටත ප්‍රශ්න කිරීම් සිදු නොකළ යුතු ය. එවැනි තත්ත්වයන් ඇති වූ විට, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකුගෙන් (උදා: නියෝජ්‍ය පොලිස්පති) ලිඛිත අනුමැතිය ලබා ගත යුතු අතර, එම අතිවිශේෂ අවස්ථාවන්ගේ ස්වභාවය ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියාගේ ලිඛිත අනුමැතිය සමඟ ලිඛිතව සටහන් කළ යුතු ය.

3.4 විමර්ශන කාර්යයක් සඳහා රැඳවියෙකු පොලිස් ස්ථානයෙන් පිටතට රැගෙන ගියහොත්, එසේ රැගෙන යාමට බලය දුන් අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා රැඳවියාගේ ආරක්ෂාව සහ රැකවරණය සම්බන්ධයෙන් පූර්ණ වගකීම භාර ගත යුතු ය.

3.5 ප්‍රශ්න කිරීම් රැඳවියාට සන්නිවේදනය කිරීමට පහසු භාෂාවකින් පැවැත්විය යුතු ය. පොලිස් නිලධාරීන් රැඳවියාගේ භාෂාව සන්නිවේදන ප්‍රවීනතාවයක් නොමැත්තේ නම්, ප්‍රශ්න කිරීම් ආරම්භ කිරීමට පෙර භාෂා පරිවර්තකයෙකුගේ සේවය ලබා ගැනීමට පියවර ගත යුතු ය.

3.6 ප්‍රශ්න කිරීම් සිදුකරන පොලිස් නිලධාරීන් ඔවුන්ගේ නිල ඇඳුමේ නිවැරදි, දෘශ්‍යමාන සහ පැහැදිලි හඳුනාගැනීම් දැරිය යුතු ය. ප්‍රශ්න කිරීම සිදුකරන ස්ථානයෙහි වෙනත් නිලධාරීන් සිටී නම් ඔවුන් පිළිබඳවද රැඳවියා දැනුම්වත් කළ යුතු ය.

3.7 ප්‍රශ්න කිරීමක අරමුණ විය යුත්තේ කරුණු හෙළිදරව්කර ගැනීම සහ විශ්වාසදායක තොරතුරු ලබා ගැනීම පමණි. පාපොච්චාරණය කිරීමට, ස්වයං පාපෝච්චාරණය කිරීමට හෝ වෙනත් පුද්ගලයෙකුට එරෙහිව සාක්ෂි දීමට රැඳවියාට බල කිරීම උදෙසා ප්‍රශ්න කිරීම් භාවිත නොකළ යුතු ය.

3.8 දීර්ඝ ප්‍රශ්න කිරීම් අවශ්‍ය වූ විට, රැඳවියාගේ පහසුව පිණිස ප්‍රමාණවත් විවේකයක් ලබා දිය යුතු ය.

3.9 ප්‍රශ්න කිරීම් සිදුකරන පොලිස් නිලධාරීන් වෙතින් යම් රැඳවියෙකු තම නීතිඥවරයාගෙන් උපදෙස් ලබා ගැනීමට ඉල්ලා සිටින්නේ නම්, ඒ රැඳවියාට ඒ සඳහා අවසර ලබාදිය යුතු ය. රැඳවියා බලපෑමකින් අපරාධ පාපෝච්චාරණයක් කිරිම වැලැක්වීමටත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(3) ව්‍යවස්ථාව ප්‍රකාරව සාධාරණ නඩු විභාගයකට ඉඩ සැලැස්වීමත් මෙමගින් තහවුරු කෙරේ.

*සැකකරු මාරු කිරීම*

3.10 'මාරු කිරීම්' යන්නට අත්අඩංගුවට පත් තැනැත්තෙකු හෝ රැඳවියෙකු අත්අඩංගුවට ගත් ස්ථානයේ සිට පොලිස් ස්ථානයට, පොලිස් ස්ථානයේ සිට වෙනත් නීත්‍යානුකූල සහ නිසි ලෙස බලය ලත් ස්ථානයකට ගෙනයාම සහ එම බලයලත් ස්ථානයේ සිට නැවත පොලිස් ස්ථානය වෙත රැගෙන යාම ඇතුළත් වේ. එවැනි බලයලත් ස්ථානයක් යන්නට රෝහලක්, නඩු භාණ්ඩයක් සොයාගැනීමේ ස්ථානයක්, උසාවියක් හෝ පූර්ව නඩු විභාග සඳහා රඳවා ගැනීමේ පහසුකමක් සහිත ස්ථානයක් ඇතුළත් විය හැකි ය.

3.11 සැකකරු භාරව සිටින පොලිස් නිලධාරීන් අත්අඩංගුවට ගත් තැනැත්තා හෝ රැඳවියා හැකිතාක් මහජන දර්ශනයට නිරාවරණය නොවන බවටත්, මහජනයාගෙන් සිදුවන අපහාස, හිරිහැර හෝ තුවාල වලින් ආරක්ෂා වන බවටත් සහතික විය යුතු ය.

3.12 අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු හෝ රැඳවියෙකු වෙනත් ස්ථානයක රැගෙන යා යුත්තේ ආරක්ෂිත සහ සුදුසු ප්‍රවාහන ක්‍රමයකින් පමණි. එවැනි තැනැත්තන් රැගෙන යාම සඳහා අවසර දී ඇති වාහන හදිසි අනතුරකදී හෝ හදිසි අවස්ථාවකදී එකී තැනැත්තන්ට සහ ඔවුන් සමඟ ගමන්කරන පොලිස් නිලධාරීන්ට සිදුවිය හැකි හානිය අවම කිරීමට ප්‍රමාණවත් වන පරිදි සකස්කර තිබිය යුතු ය.

3.13 රැඳවියෙකු සාක්ෂිමය අයිතමයක් සොයා ගන්නා ස්ථානයකට රැගෙන යනු ලබන්නේ නම්, එසේ රැගෙන යාමට පෙර, අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා (සහකාර පොලිස් අධිකාරි නිලයට නොඅඩු) විසින් පහත පියවර ගත යුතු ය:

අ) සාක්ෂිමය අයිතමය සම්බන්ධයෙන් රැඳවියා විසින් හෙළිදරව් කරන ලද තොරතුරු තහවුරුකර ගැනීම (හැකි නම්, අවට පරිසරයේ ආරක්ෂාව සහ ප්‍රදේශයේ සැක සහිත පුද්ගලයින් සිටීදැයි පරීක්ෂා කිරීම සඳහා පොලිස් නිලධාරීන් කණ්ඩායමක් එම ස්ථානයට යෙදවිය යුතු ය. ); සහ

ආ) රැඳවියා ප්‍රකාශිත ස්ථානයට රැගෙන යාමේදී ඇති විය හැකි අවදානම තක්සේරු කිරීම.

3.14 රැඳවියෙකු විසින් සපයනු ලබන තොරතුරු වල විශ්වසනීයත්වය සහ එවැනි පුද්ගලයෙකු ප්‍රකාශිත ස්ථානයට රැගෙන යාමේ අවදානම් මට්ටම මත පදනම්ව, අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා විසින්:

අ) සොයා ගැනීමේ මෙහෙයුම සඳහා යෙදවිය යුතු පොලිස් නිලධාරීන්ගේ සංයුතිය සහ සංඛ්‍යාව;

ආ) මෙහෙයුම සඳහා යෙදවිය යුතු වාහන වර්ගය සහ සංඛ්‍යාව;

ඇ) මෙහෙයුම අතරතුර පොලිස් නිලධාරීන් සන්නද්ධව සිටිය හැකි බලයලත් නිරෝධක මාධ්‍යයන් සහ ආයුධ;

ඈ) මෙහෙයුම අතරතුර කණ්ඩායම අනුගමනය කළ යුතු අණ දාමය; සහ

ඉ) මෙහෙයුම දියත් කරන දිනය සහ වේලාව; තීරණය කළ යුතු ය.

3.15 අනතුරුදායක යැයි සාධාරණ ලෙස තක්සේරු කර ඇති රැඳවියෙකු රැගෙන යාමේදී, රැඳවියාට සහ වෙනත් අයවළුන්ට වියහැකි හානිය අවම වන පරිදි ක්ෂේත්‍රයේ තීරණ ගැනීමේ හැකියාව ඇති මනා පළපුරුදු සහ පුහුණු නිලධාරීන් මෙහෙයුම සඳහා අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ කණ්ඩායමේ සංයුතියට ඇතුළත් විය යුතු ය.

3.16 මෙහෙයුම භාර අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා විසින් සාමාන්‍යයෙන්, මෙහෙයුම් දිවා කාලයේ දී සිදුකිරීමට සැලසුම් කළ යුතු ය. රාත්‍රී කාලයේ මෙහෙයුමක් දියත් කළ යුත්තේ මෙහෙයුම කාල සංවේදී වන හෝ දිවා කාලයේ මෙහෙයුම ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි අවස්ථාවන්හිදී පමණි.

3.17 මෙහෙයුමක් රාත්‍රියේ සිදුකිරීමට සැලසුම් කර ඇත්නම්, අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා විසින් රැඳවියාගේ සහ පොලිස් නිලධාරීන්ගේ පූර්ණ ආරක්ෂාව සහතික කිරීම සඳහා අමතර පූර්වාරක්ෂක පියවර ගත යුතු ය. එවැනි පූර්වාරක්ෂක පියවර අතරට අදාළ ස්ථානය සහ එහි වටපිටාව පිළිබඳ පැහැදිලි දෘශ්‍යතාව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ආලෝකකරණ උපකරණ පැවතීම ඇතුලත් වේ. මෙහෙයුම භාර අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා රැඳවියාගේ ආරක්ෂාව පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගත යුතු අතර මෙහෙයුම සඳහා වේලාව, ස්ථානය, සහභාගී වූ නිලධාරීන් සහ හේතු පිළිබඳ ලිඛිත වාර්තාවක් තබා ගත යුතු ය.

3.18 සෑම මෙහෙයුමක් සඳහාම අනුයුක්ත කරනු ලබන සියලුම පොලිස් නිලධාරීන් මෙහෙයුමේ විෂය පථය සහ අරමුණ, ඔවුන්ගේ නිශ්චිත කාර්යභාරයන් සහ එවැනි මෙහෙයුමක් හා සම්බන්ධ අවදානම් සහ අභියෝග පිළිබඳව සවිස්තරාත්මකව දැනුම්වත් කරනු ලැබිය යුතු ය.

## 4. බලය භාවිතා කිරීම සහ ආයුධ හැසිරවීම

***බලය භාවිතා කිරීම පිළිබඳ පොදු මූලධර්ම***

4.1 පොලිස් නිලධාරීන්, තම රාජකාරිය ඉටු කිරීමේදී, බලය භාවිත කළයුත්තේ ප්‍රචණ්ඩකාරී නොවන සියලුම ක්‍රමවේද උපයෝගී කරගැනීමෙන් අනතුරුව පමණි. ප්‍රචණ්ඩකාරී නොවන ක්‍රමවේද අවසන් වී ඇතැයි සැලකිය හැක්කේ අදාළ රාජකාරි නීත්‍යානුකූලව ඉටු කිරීමේදී එවැනි ක්‍රමවේද නිෂ්ඵල වන විට පමණි.

4.2 පොලිස් නිලධාරියෙකු ගිනි අවි භාවිතය ඇතුළු බලය යෙදවිය යුත්තේ තම රාජකාරිය ඉටු කිරීම හා සම්බන්ධ නීත්‍යානුකූල අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා සහ නීතියෙන් නියම කර ඇති ආකාරයට පමණි.

4.3 පොලිස් නිලධාරියෙකුට බලය භාවිත කිරීමට අවශ්‍ය වන්නේ නම්, එසේ භාවිත කරන බලය අවශ්‍යතාවය, සාධාරණත්වය සහ සමානුපාතික යන මූලධර්මවලට දැඩි ලෙස අනුගත විය යුතු ය.

4.4 බලය භාවිත කිරීමට බලය පවරමින් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන ඕනෑම නියෝගයක් මඟින් නීතියට අනුකූලව බලය භාවිත කිරීම සඳහා පැහැදිලි සීමාවන් පිළිබිඹු විය යුතු ය. එවැනි නියෝග අනුව සිදු කරනු ලබන කවර හෝ අනවශ්‍ය, අයුක්තිසහගත හෝ සමානුපාතික නොවන ලෙස බලය භාවිත කිරීම් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම එවැනි නියෝග ලබාදුන් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් භාරගත යුතු ය.

4.5 බලය යෙදවීම නීත්‍යානුකූලව අවශ්‍ය වන විට, යොදවා ඇති සියලුම පොලිස් නිලධාරීන් විසින් තමාට හැකි පමණින් ජීවිත හානි වළක්වා ගැනීමට සහ අත්අඩංගුවට ගනිමින් සිටින හෝ අත් අඩංගුවට ගත් රැඳවියෙකු ඇතුළු ඕනෑම පුද්ගලයෙකුට සිදුවිය හැකි හානි හා තුවාල අවම කර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු ය. එවැනි ප්‍රයත්නවලට පොලිසිය විසින් බලය

යෙදවීමේ ප්‍රතිඵලයක් ලෙස තුවාල වූ හෝ විපතට පත් වූ ඕනෑම පුද්ගලයෙකුට උපකාර කිරීම සහ කඩිනමින් සැපයීමට කටයුතු කල යුතු වේ.

### *නිරෝධක ක්‍රම*

4.6 පොලිස් නිලධාරීන් විසින් දඬුවම් කිරීමේ මාධ්‍යයක් ලෙස නිරෝධක ක්‍රම හෝ උපකරණ භාවිත කිරීමෙන් වැළකිය යුතු ය. එවැනි ශිල්පීය ක්‍රම හෝ උපකරණ භාවිත කළ යුත්තේ අත් අඩංගුවට ගත් පුද්ගලයෙකු හෝ රැඳවියෙකු පාලනය කර ගැනීමට සහ එවැනි පුද්ගලයෙකු පැන යාමෙන් හෝ වෙනත් පුද්ගලයෙකුට හානියක් කිරීම වැළැක්වීමට අවශ්‍යවන ප්‍රමාණයට පමණි.

4.7 අත්අඩංගුවට ගත් තැනැත්තෙකු හෝ රැඳවියෙකු පාලනය කිරීම සඳහා යොදාගන්නා නිරෝධක ක්‍රම නීත්‍යානුකූල විය යුතු සහ ඒ සඳහා නිසි ලෙස බලය පවරනු ලැබ තිබිය යුතු අතර එම තැනැත්තාගේ අභිමානයට ගරු කරන මෙන්ම කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත නොවිය යුතු ය.

### *අවසරලත් ආයුධ භාවිතය*

4.8 අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයෙකු හෝ රැඳවියෙකු සන්නද්ධ ප්‍රතිරෝධයක් ඉදිරිපත් කරන විට හෝ වෙනත් ආකාරයකින් අන්‍යයන්ගේ ජීවිත අනතුරේ හෙළන අවස්ථාවක සහ එවැනි පුද්ගලයෙකු මෙල්ල කිරීමට විකල්ප ක්‍රම නොමැති අවස්ථාවක හැර අන් කිසිම අවස්ථාවක ගිනි අවි භාවිත නොකළ යුතු ය.

4.9 ගිනි අවියක් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන විට සහ අවශ්‍ය වූ විට, අදාළ තැනැත්තා විසින් සන්නද්ධ ප්‍රතිරෝධය දැක්වීම හෝ අන්‍යයන්ගේ ජීවිත අනතුරේ හෙළීම නතර කර යටත් වන්නේ නම් මිස, ගිනි අවිය ක්‍රියාත්මක කිරීමට අදහස් කරන පොලිස් නිලධාරියා විසින් ගිනි අවිය ක්‍රියාත්මක කරන බවට අදාළ තැනැත්තාට පූර්ව අනතුරු ඇඟවීමක් කළ යුතු ය.

4.10 පොලිස් නිලධාරියෙකු විසින් දෛනිකව භාවිත නොකරන ආයුධයක් විශේෂ මෙහෙයුමක් සඳහා යම් නිලධාරියෙකුට ලබා දීමේ දී, එවැනි ආයුධයක් අදාළ නිලධාරියාට ලබා දීමට පෙර, එය භාවිත කිරීමට අවසර දෙන අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා විසින් එම අවිය භාවිත කිරීමට අදාළ පොලිස් නිලධාරියා සතු දැනුම සහ හැකියාව තහවුරු කර ගත යුතු ය.

## 5. වාර්තා තබා ගැනීම

### *අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව*

5.1 සාපරාධී වරදක් හෝ වරදක් කිරීමට තැත් කිරීමක් සම්බන්ධයෙන් ලැබෙන ඕනෑම තොරතුරක් හෝ ලිඛිතව සටහන් කළ යුතු ය. එවැනි තොරතුරු ඉහළ බලධාරියෙකුගෙන් ලැබෙන්නේ නම්, එවැනි ඉහළ අධිකාරිය පිළිබඳ විස්තර ලිඛිතව සටහන් කළ යුතු ය.

5.2 පුද්ගලයෙකු අත්අඩංගුවට ගන්නා ඕනෑම නිලධාරියෙකු අත්අඩංගුවට ගැනීම පිළිබඳ නිවැරදි වාර්තාවක් තැබිය යුතු ය, ඒවා අතර:

අ) අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ නම, වයස, සමාජභාවය සහ ලිපිනය;

ආ) අත්අඩංගුවට ගත් දිනය සහ වේලාව;

ඇ) අත්අඩංගුවට ගත් ස්ථානය;

ඈ) අත්අඩංගුවට ගැනීමට හේතුව;

ඉ) සැකකරු අත්අඩංගුවට ගැනීමට තුඩුදුන් අවස්ථාගත කරුණු;

ඊ) අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ පොලිස් නිලධාරීන්ගේ අනන්‍යතාවයන් (අත්අඩංගුවට ගැනීමට නියෝග කළ හෝ බලය පවරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියා ද ඇතුළුව);

උ) අත්අඩංගුවට ගැනීම, අත්අඩංගුවට ගැනීමට හේතුව ගැන දැනුම් දුන් අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ පවුලේ සාමාජිකයාගේ හෝ මිතුරාගේ නම; සහ

එ) පොලිස් නිලධාරියා විසින් නිරීක්ෂණය කරන ලද හෝ අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ එම පුද්ගලයා විසින් ප්‍රකාශ කරන ලද අත් අඩංගුවට ගත් පුද්ගලයාගේ කිසියම් තුවාල හෝ රෝග තත්ත්වයන්.

5.3 ඉහත වාර්තාව පහසු සන්නිවේදන මාධ්‍යකින් කියවා දැනුම් දිය යුතු ය.

5.4 කුවිතාන්සියක් නිකුත් කිරීම අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ පවුලේ සාමාජිකයෙකුට එම පුද්ගලයා තෝරා ගන්නා මිතුරෙකුට හෝ එම පුද්ගලයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥයෙකුට භාර දිය යුතු ය. ශ්‍රී ලංකා පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලබන සැකකරුවන් / සැකකාරියන් අත්අඩංගුවට ගැනීමේ කුවිතාන්සි පත් නිකුත් කිරීම යන මැයෙන් 2018 වර්ෂයේ දී නිකුත් කළ පොලිස්පති චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු ය.

*රඳවා තබා ගැනීමේදී*

5.5 අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයක රඳවා සිටින සියලුම පුද්ගලයන්ගේ ඇතුල්වීමේ සහ පිටවීමේ ලේඛනයක් එවැනි පොලිස් ස්ථානයක පවත්වාගෙන යා යුතු අතර එහි පහත සඳහන් කරුණු නිවැරදිව ඇතුළත් විය යුතු ය:

අ) අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ හෝ රැඳවියාගේ අනන්‍යතාව;

ආ) ඇතුළත් කරනු ලැබූ වේලාව;

ඇ) අත්අඩංගුවට ගත් පුද්ගලයා භාර දෙන නිලධාරියා;

ඈ) පොලිස් නිලධාරියා විසින් නිරීක්ෂණය කරන ලද හෝ අත්අඩංගුවට ගත් පුද්ගලයා හෝ රැඳවියා විසින් ප්‍රකාශ කරන ලද අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ හෝ රැඳවියාගේ යම් තුවාල හෝ රෝග තත්ත්වයන්;

ඉ) අත්අඩංගුවට ගත් පුද්ගලයා සතුව තිබූ පොලිස් භාරයට ගෙන ඇති කිසියම් පෞද්ගලික භාණ්ඩ ලැයිස්තුවක්;

ඊ) සැකකරු ස්ථානයෙන් පිටතට රැගෙන යනු ලබන්නේ නම් ගෙන යනු ලබන ස්ථානය;

උ) පිටවීමේ වේලාව;

ඌ) පිටවීමට හේතුව;

එ) නැවත පැමිණි වේලාව; සහ

ඒ) රැඳවියා සමඟ එවැනි වෙනත් නීත්‍යානුකූල සහ නිසි ලෙස බලයලත් රැඳවුම් ස්ථානයකට යන නිලධාරීන්.

5.6 රැඳවියෙකුගේ අත්අඩංගුව භාරව සිටින පොලිස් නිලධාරීන් පැහැදිලිව නම් කර නිසි ලෙස සටහන් කළ යුතු ය. මෙම වාර්තාවට අදාළ පොලිස් නිලධාරීන්ගේ 'රාජකාරි භාරගත්' සහ 'රාජකාරී අවසන් කළ' වේලාවන් ඇතුළත් විය යුතු ය.

5.7 රැඳවියෙකුගේ අත්අඩංගුව භාරව සිටින පොලිස් නිලධාරීන් තමන් භාරයේ සිටින පුද්ගලයන් සම්බන්ධයෙන් පහත තොරතුරු සටහන් කළ යුතු ය.

අ) රැඳවියා විසින් කරන ලද යම් වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලීම් සහ එම ඉල්ලීම් කළ වේලාව;

ආ) රැඳවියාට ලබා දෙන ඕනෑම ප්‍රථමාධාර හෝ සුපුරුදු ඖෂධ (එවැනි වාර්තාවකට ලබා දෙන ඖෂධයේ නම සහ මාත්‍රාව, ඒවා ලබාදුන් වේලාව ඇතුළත් විය යුතු ය);

ඇ) අවශ්‍ය අවස්ථාවලදී, රැඳවියාට ලබා දෙන ඕනෑම ආහාර වේලක්;

ඈ) රැඳවියා බැලීමට පැමිණෙන ඕනෑම පුද්ගලයෙකුගේ අනන්‍යතාව සහ එසේ පැමිණි දිනය සහ වේලාව; සහ

ඉ) වෙනත් අදාළ නිරීක්ෂණ.

***විමර්ශන සහ පරීක්ෂණ වලින් අනතුරුව***

5.8 අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු හෝ රැඳවියෙකු සම්බන්ධයෙන් සිදු කරන විමර්ශනය හෝ පරීක්ෂණය භාරව සිටින පොලිස් නිලධාරියා එම විමර්ශනයට හෝ පරීක්ෂණයට අදාළ සියලු විස්තර ලිඛිතව නිවැරදිව වාර්තාකර තබා ගත යුතු ය.

5.9 එවැනි නිලධාරියෙකුට එම විමර්ශනය හෝ පරීක්ෂණය, පරීක්ෂණයට සහභාගී වන පොලිස් නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ගේ විස්තර ඇතුළුව, විමර්ශනය හෝ පරීක්ෂණයට අදාළ සියලුම තොරතුරු පිළිබඳ සම්පූර්ණ දැනුමක් තිබිය යුතු ය. එවැනි නිලධාරියෙකු තම විෂය පථය යටතේ පවත්වනු ලබන විමර්ශන හෝ විමර්ශනවලට අදාළ සියලු තොරතුරු සම්බන්ධයෙන් වගවීම සහ පිළිතුරුදීම සිදු කළ යුතු ය.

5.10 සියලුම පරීක්ෂණ වාර්තා ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ස්ථානයක තබා ගත යුතු අතර නීතියෙන් බලය ලත් ඕනෑම අධිකරණකට හෝ වෙනත් නිසි අධිකාරියකට හෝ ආයතනයකට එවැනි වාර්තා ලබා ගැනීමට අවස්ථාව සලසා දිය යුතු ය.

## 6. වාර්තා කිරීම සහ වගවීම

***මරණය සිදුවූ ස්ථානය ආරක්ෂා කිරීම***

6.1 අත්අඩංගුවේ දී හෝ පොලිසිය සමඟ සිදුවන ගැටුමක දී මරණයක් සිදු වුවහොත්, එම ස්ථානය පිළිබඳ සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා අවසන් කරන තෙක්, මරණයට හේතුව සහ මරණය සිදු වූ ආකාරය නොසලකා මරණය සිදුවූ ස්ථානය අපරාධ ස්ථානයක් ලෙස සැලකිය යුතු ය.

6.2 අත්අඩංගුවේදී හෝ පොලිසිය සමග සිදුවන ගැටුමකදි සිදුවන මරණ සම්බන්ධව කඩිනමින් අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත දැනුම්දිය යුතු ය. අධිකරණ වෛද්‍ය නිලධාරීන් මරණ සම්බන්ධයෙන් සුදුසු පරිදි පශ්චාත් මරණ පරීක්ෂණය කළ යුතු අතර, එකී වාර්තාව පහත සඳහන් ස්වාධීන විමර්ශන කමිටුවට වාර්තා කළ යුතු ය.

6.3 එවැනි මරණයක් අනාවරණය වූ වහාම මරණය සිදුවූ ස්ථානයට ප්‍රවේශය සීමා කළ යුතු ය. මරණයට හේතුව සහ මරණය සිදුවූ ආකාරය පිළිබඳව පරීක්‍ෂණ පවත්වන වෛද්‍ය නිලධාරීන් සහ අපරාධ ස්ථානීය විමර්ශන නිලධාරීන් (SOCO) වැනි බලයලත් පුද්ගලයන් හා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් හැර වෙනත් කිසිවකුට මෘත දේහය වෙත ප්‍රවේශ වීමට ඉඩ නොදිය යුතු ය.

6.4 මරණය සිදු වූ ස්ථානයට ඇතුළු වීමට ප්‍රවේශය ලබා දී ඇති සහ එම ස්ථානයට ඇතුළු වන සියලුම පුද්ගලයින්ගේ අනන්‍යතාව එම පුද්ගලයින් එම ස්ථානයට ඇතුළු වීමට තුඩුදුන් හේතු ද සමඟ නිසි ලෙස සටහන් කළ යුතු ය.

6.5 විමර්ශන කටයුතු සඳහා මරණය සිදුවූ ස්ථානයට ප්‍රවේශය ලබා දී ඇති සියලුම පොලිස් නිලධාරීන් විසින් සාක්ෂි දූෂ්‍ය වීමට හේතු විය හැකි කවර හෝ ආකාරයකින් කටයුතු නොකොට, නිසි ක්‍රියා පටිපාටියට අනුව සාක්ෂි ආරක්ෂා කරනු ලබන බවට වගබලා ගත යුතු ය.

***මරණය සිදුවූ ස්ථානය විමර්ශනය කිරීම***

6.6 SOCO කණ්ඩායම විසින් අත්අඩංගුවේදී හෝ පොලිසිය සමඟ සිදුවූ ගැටුමකදී සිදුවූ මරණයට සම්බන්ධ සියලුම වැදගත් සාක්ෂි එකතු කර ඒවා විනාශ වීම හෝ දූෂ්‍ය වීම වළක්වන ආකාරයෙන් සංරක්ෂණය කර ඇති බවට සහතික විය යුතු ය. එවැනි සියලු සාක්ෂි සඳහා පැහැදිලි 'භාරකාරත්ව දාමයක්' පවත්වා ගත යුතු අතර, එම භාරකාරත්ව දාමය පිළිබඳ ලිඛිත වාර්තාව විමර්ශන නිලධාරියා විසින් අත්සන් කළ යුතු අතර එක් එක් සාක්ෂි අයිතමය මෙහෙයවීමේ දිනය සහ වේලාව එහි සටහන් කළ යුතු ය.

6.7 අධිකරණ වෛද්‍ය සහ රජයේ රස පරීක්ෂක වෙත යොමු කරන සාක්ෂි ඇතුළු, සියලුම වැදගත් ද්‍රව්‍ය හා වාර්තා අදාළ බලධාරීන් වෙත කඩිනමින් යොමු කළ යුතු ය.

6.8 මරණය සිදු වූ ස්ථානයේ සහ මරණය සිදු වූ ස්ථානය ආසන්නයේ සිටි පුද්ගලයින්ගෙන් සවිස්තරාත්මක සහ විස්තීරණ ප්‍රකාශ ලබා ගත යුතු ය. මරණය සිදු වූ ස්ථානයේ දී මෘත දේහය පරීක්ෂා කරන ඕනෑම වෛද්‍ය නිලධාරියෙකුගෙන් ද සවිස්තර වාර්තා ලබා ගත යුතු ය.

***මෘතදේහය රැගෙනයාම***

6.9 අත්අඩංගුවේදී හෝ පොලිසිය සමඟ ගැටුමකදී මරණයක් සිදුවූ විට, මියගිය තැනැත්තාගේ දේහය සම්බන්ධයෙන් සෑම විටම නිසි ගෞරවයෙන් යුතුව කටයුතු කළ යුතු ය.

6.10 මෘතදේහය රැගෙනයාම සඳහා සූදානම් කිරීමේදී, SOCO කණ්ඩායම විසින් දේහය පවතින ආකාරයෙන්ම ගෙන යන බවට සහතික විය යුතු අතර පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන ස්ථානයට දේහය රැගෙනයාම සමීපව අධීක්ෂණය කළ යුතු ය. එවැනි අධීක්ෂණ කටයුතු නිසි ලෙස සටහන් කර SOCO විමර්ශන වාර්තාවට ඇතුළත් කළ යුතු ය.

***වෛද්‍ය, අධිකරණ වෛද්‍ය සහ ප්‍රාක්ෂේප සාක්ෂි පිළිබඳ වාර්තා***

6.11 අදාළ බලධාරීන් විසින් මරණ පරීක්ෂණ වාර්තා, අදාල වන පරිදි රජයේ රස පරීක්ෂක වාර්තා සහ වෙනත් වාර්තා ඇතුළුව වෛද්‍ය, අධිකරණ වෛද්‍ය සහ අනෙකුත් සාක්ෂිවලට අදාළ සියලුම වාර්තා හැකි ඉක්මනින් සකස් කළ යුතු ය.

6.12 එවැනි වාර්තා විකෘති කළ නොහැකි බව සහතික වන ආකාරයෙන් සංරක්ෂණය කළ යුතු ය. ඒවා විමර්ශනය කරන අදාළ නිලධාරීන්ට සහ නඩු පැවරීමකදී අදාළ නඩු පවරන සහ අධිකරණ බලධාරීන්ට ලබා දිය යුතු ය.

*ළඟම ඥාතීන් සමඟ සන්නිවේදනය කිරීම*

6.13 මියගිය අයගේ පවුලේ සාමාජිකයෙකුට හෝ මිතුරෙකුට මරණය පිළිබඳව වහාම දැනුම් දිය යුතු ය. මියගිය ස්ථානය සහ මියගිය පුද්ගලයාගේ දේහය රැගෙනගිය ස්ථානය පිළිබඳ තොරතුරු පවුලේ සාමාජිකයාට හෝ මිතුරාට ද දැනුම් දිය යුතු ය.

6.14 විමර්ශනවල ප්‍රගතිය පිළිබඳව මියගිය අයගේ පවුලේ සාමාජිකයෙකු හෝ මිතුරෙකු දැනුම්වත් කළ යුතු ය.

6.15 මරණ පරීක්ෂණයෙන් පසු මරණකරුගේ අවයව වැඩිදුර පරීක්ෂණ සඳහා රඳවා තබා ගැනීමට අවශ්‍ය නම්, ඒ පිළිබඳව මියගිය අයගේ පවුලේ අයට දැනුම් දිය යුතු ය. පරීක්ෂණය අවසන් වූ පසු එවැනි අවයව මියගිය අයගේ පවුලේ අයට නිදහස් කළ යුතු ය.

6.16 මරණයට පෙර පොලිස් භාරයේ තිබූ මියගිය පුද්ගලයාගේ පෞද්ගලික බඩු බාහිරාදිය සහ මිය යන විට මියගිය පුද්ගලයා සන්තකයේ තිබූ ඕනෑම භාණ්ඩයක් හැකි ඉක්මනින් මියගිය අයගේ පවුල වෙත ආපසු ලබා දිය යුතු ය.

6.17 පශ්චාත් මරණ පරීක්ෂණය සහ අනෙකුත් අදාළ පරීක්ෂණ අවසන් වූ පසු මියගිය පුද්ගලයාගේ දේහය ගෞරවාන්විතව ළඟම ඥාතීන් වෙත භාර දිය යුතු ය.

6.18 පොලිස් නිලධාරීන් විසින් මියගිය අයගේ පවුලේ අය හෝ මිතුරන් සමඟ සන්නිවේදනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම කළ යුත්තේ මියගිය පුද්ගලයාගේ සහ මියගිය අයගේ පවුලේ සාමාජිකයන්ගේ සහ මිතුරන්ගේ අභිමානයට ගරු කරන ආකාරයටය.

*මරණය සම්බන්ධයෙන් මාධ්‍ය ප්‍රකාශ නිකුත් කිරීම*

6.19 අත්අඩංගුවේදී හෝ පොලීසිය සමඟ සිදුවූ ගැටුමකදී සිදුවූ මරණයක් සම්බන්ධයෙන් කිසියම් ප්‍රකාශයක් සිදුකිරීමේදී, පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා විසින් සෑම විටම මියගිය පුද්ගලයාගේ පෞද්ගලිකත්වය සහ ගෞරවය ආරක්ෂා කළ යුතු ය.

6.20 අත්අඩංගුවට ගැනීමට හේතුව, මියගිය පුද්ගලයාගේ අතීත අපරාධ වාර්තාව සහ මියගිය පුද්ගලයාගේ හෝ මියගිය පුද්ගලයාගේ පවුලේ අයගේ වාර්ගිකත්වය, ආගම, හෝ පදිංචි ස්ථානය වැනි වෙනත් පෞද්ගලික තොරතුරු සම්බන්ධයෙන් විස්තර මාධ්‍ය වෙත නිකුත් නොකළ යුතු ය.

6.21 මාධ්‍ය වෙත තොරතුරු නිකුත් කිරීමේදී අදාළ පොලිස් නිලධාරීන් විසින් මියගිය පුද්ගලයා වරදකරු බව ඔප්පු වන තුරු නිර්දෝෂී යැයි සැලකීමට ඇති අයිතියට ගරු කළ යුතු ය. මියගිය පුද්ගලයා අපරාධයක් සම්බන්ධයෙන් සැකකරුවෙකු හෝ චූදිතයෙකු පමණක් වූ විට, එවැනි පුද්ගලයෙකු 'අපරාධකරුවෙකු' හෝ 'වරදකරුවෙකු' ලෙස නිරූපණය නොකළ යුතු ය.

*මරණය සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම*

6.22 අත්අඩංගුවේදී හෝ පොලීසිය සමඟ ගැටුමකදී මරණයක් සිදුවූ විට, ස්වාධීන විමර්ශන කමිටුවක් මඟින් පරීක්ෂණයක් පැවැත්විය යුතු ය. එම කණ්ඩායම පහත සඳහන් නිලධාරීන්ගෙන් (සේවයේ නියුතු හෝ විශ්‍රාමික) උපදෙස් ලබා ගැනීමට කටයුතු කල යුතු ය:

අ) නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු නිලයට නොඅඩු නිලධාරියෙකු;

ආ) අධිකරණ වෛද්‍ය නිලධාරියෙක්;

ඇ) රජයේ රස පරීක්ෂක විසින් නම් කළ ඔහුගේ නියෝජිතයෙකු;

ඈ) (ගිනි අවි නිසා සිදුවන මරණයකදී) ගිනි අවි පිළිබඳ විශේෂඥයෙක්; සහ

ඉ) විනිශ්චයකාරවරයෙකු හෝ නීතිඥයෙකු වන නීති වෘත්තිකයෙක්

6.23 එවැනි විමර්ශනයක් කඩිනම්, ඵලදායී, පුළුල් වූ, අපක්ෂපාතී සහ විනිවිදභාවයකින් යුක්ත විය යුතු ය.

6.24 පත් කරනු ලබන ස්වාධීන විමර්ශන කමිටුවේ කාර්යයන් වන්නේ වෙනත් දෑ අතර :

අ) සියලුම ප්‍රකාශයන් සහ වාර්තාමය, ඩිජිටල් සහ භෞතික සාක්ෂි එකතු කිරීම සහ තහවුරු කිරීම;

ආ) කිසියම් පොලිස් නිලධාරියෙකු මරණයට වගකිව යුතුද යන්න නිවැරදිව නිර්ණය කිරීම;

ඇ) මරණය වැළක්වාලිය හැකිව තිබූ පියවර හඳුනා ගැනීම; සහ

ඈ) මරණය හේතු සාධක විය හැකි වූ පද්ධතිමය අසාර්ථකත්වය හඳුනා ගැනීම.

6.25 විමර්ශන ක්‍රියාවලිය සහ ප්‍රතිඵල විනිවිද භාවයකින් යුතු බවත් මියගිය පුද්ගලයාගේ පවුලේ අයගේ සහ මහජනතාවගේ පරීක්ෂාවට විවෘත බවත් ශ්‍රී ලංකා පොලිසිය සහ ස්වාධීන විමර්ශන කමිටුව විසින් සහතික කළ යුතු ය. මෙහිදී විනිවිදභාවය පිළිබඳ සීමාවක් විය යුත්තේ, බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම, සිදු කෙරෙන විමර්ශනවල අඛණ්ඩතාව සහතික කිරීම, හෝ බුද්ධි මූලාශ්‍ර හෝ පොලිස් මෙහෙයුම් පිළිබඳ රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම වැනි නීත්‍යානුකූල අරමුණක් සඳහා එසේ සීමා කිරීම දැඩි ලෙස අවශ්‍ය වන ප්‍රමාණයට පමණි.

6.26 විමර්ශනය අවසන් වූ පසු, පොලිස් නිලධාරියෙකු, කිසිදු නීත්‍යානුකූල හිමිකමකින් තොරව (උදා: ආත්මාරක්ෂාව සඳහා ඇති අයිතිය), අත්අඩංගුවේදී හෝ පොලිසිය සමඟ ගැටුමකදී සිදුවූ මරණයක් සම්බන්ධයෙන් වගකිව යුතු බව පෙනී ගියහොත්, එම නිලධාරියාට එරෙහිව කඩිනමින් නඩු පැවරීමටත්, විනය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමටත් කටයුතු කළ යුතු ය. එවැනි අවස්ථාවලදී විනය තීරණය ජාතික පොලිස් කොමිසමට දැනුම් දිය යුුතුය.

6.27 අත්අඩංගුවේදී හෝ පොලිසිය සමඟ සිදුවන ගැටුමකදී සිදුවන මරණ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියෙකුට එරෙහිව නඩු පැවරීමේදී පොලිසිය විසින් කඩිනමින් නීතිපතිවරයා වෙත අදාළ වාර්තාව යොමු කල යුතු ය.

***ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ වාර්තා කිරීම***

6.28 අත්අඩංගුවට ගත් පුද්ගලයකුගේ, රැඳවියකුගේ හෝ වෙනත් යම් පුද්ගලයකුගේ ජීවිතයට තර්ජනයක් වන බවට මානව හිමිකම් කොමිසමට දන්වන ලද අවස්ථාවක, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වහාම අදාළ පොලිස් ස්ථානය සමඟ සන්නිවේදනය කරනු ඇත.

6.29 අත් අඩංගුවට ගත් පුද්ගලයෙකුගේ හෝ රැඳවියෙකුගේ අත්අඩංගුව භාරව සිටින පොලිස් නිලධාරීන් සෑම විටම අනලස්ව සහ වගකීමෙන් යුතුව ප්‍රතිචාර දැක්විය යුතු අතර එම පුද්ගලයාගේ ආරක්ෂාව, රැකවරණය සහ යහපැවැත්ම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු ය.

6.30 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට එම පොලිස් ස්ථානය සමඟ ක්ෂණිකව සන්නිවේදනය කිරීමට සහ සම්බන්ධීකරණය කිරීමට හැකි වන පරිදි අදාළ පොලිස් ස්ථානයේ අදාල විමර්ශනය භාරව ක්‍රියා කරන නිළධාරී ලෙස ක්‍රියා කරන නිලධාරියා සම්බන්ධකරගත හැකි තොරතුරු අදාළ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දිය යුතු ය.

6.31 අත්අඩංගුවට ගත් සිටින පොලිස් නිලධාරීන් වහාම එම පුද්ගලයා අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කළ යුතු ය. පුද්ගලයෙකු හෝ රැඳවියෙකු අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කරන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව අදාළ පොලිස් ස්ථානයට නියම කරන්නේ නම් එම පුද්ගලයාගේ අත්අඩංගුව භාරව එවැනි දැන්වීමක් කිරීමෙන් පැය 24ක් ඇතුළත අදාළ පොලිස් නිලධාරීන් විසින් අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ පිටපතක් (MLEF) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

6.32 අත්අඩංගුවේදී හෝ පොලීසිය සමඟ ගැටුමකදී මරණයක් සිදුවුවහොත්, අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා එවැනි සිදුවීමක් සිදුවී පැය 24ක් ඇතුළත මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දිය යුතු ය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව ස්වයං මෙහෙයවීමෙන් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කළ හැකිය.

6.33 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඊට අදාළ ලේඛන සමඟ මූලික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට නියම කළ යුතු ය. එවැනි ඉල්ලීමක් ලැබී කඩිනමින් එකී මූලික වාර්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු ය.

6.34 මූලික වාර්තාව ඉදිරිපත් කිරීමෙන් මාස හයක් ඇතුළත ස්වාධීන විමර්ශන කමිටුව විසින් සකස් කරන ලද සවිස්තරාත්මක විමර්ශන වාර්තාවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

## නිර්දේශ

ඉහත මාර්ගෝපදේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම උදෙසා පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලිසිය උනන්දු කරවනු ලැබේ:

1. සියලුම පොලිස් නිලධාරීන් වෙනුවෙන් මෙම මාර්ගෝපදේශ අනුගමනය කිරීම පිළිබඳ පුහුණුවක් පැවැත්වීම. අභ්‍යන්තර හෝ බාහිර සම්පත් දායකයින්ගේ සහයෝගයෙන් යුතුව පොලිසියේ පුහුණුව සාමාන්‍ය කටයුත්තක් ලෙස පැවැත්විය යුතු අතර ශ්‍රී ලංකා පොලිසියේ සම්මත පුහුණු විෂය මාලාවට ඒකාබද්ධ කළ යුතු ය.

2. සියලුම පොලිස් නිලධාරීන් සඳහා අනිවාර්ය සහ සාමාන්‍ය අවි හැසිරවීමේ පුහුණුව ලබා දීම. පොලිස් මෙහෙයුම් වලදී භාවිත කිරීම සඳහා එවැනි ආයුධ ලබා දීමට පෙර ඔවුන්ගේ ආයුධ හැසිරවීමේ කුසලතා තක්සේරු කළ යුතු ය.

3. සියලුම පොලිස් නිලධාරීන්ට ප්‍රථමාධාර පිළිබඳ මූලික දැනුම සහ පුහුණුව ලබා දීම.

4. සියදිවි නසා ගැනීමට උත්සාහ කළ පුද්ගලයෙකු බැඳතැබීමට යොදාගත් බන්ධන යුහුසුළුව ඉවත් කිරීම පිළිබඳ දැනුමෙන් හා කුසලතාවන්ගෙන් සියලුම පොලිස් නිලධාරීන් සන්නද්ධ කිරීම.

5. සියලුම පොලිස් නිලධාරීන්ට තම රාජකාරිය අනලස්ව ඉටු කිරීමට හැකි වන පරිදි, අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය මාර්ගෝපදේශනය ඇතුළුව ප්‍රමාණවත් මානසික ස්ථාවරතාවයක් ඇති කර ගැනීමට සහයෝගය ලබා දීම.

6. පොලිස් ස්ථානයේ පිළිගැනීමේ ප්‍රදේශය, සිරමැදිරි, ආලින්ද සහ වෙනත් ස්ථානවල සහ වෙනත් බලයලත් රැඳවුම් ස්ථානවල සිදුවන සෑම දෙයක්ම පටිගත කිරීම සඳහා CCTV නිරීක්ෂණ කැමරා පද්ධති ස්ථාපනය කිරීමට පියවර ගැනීම. එවැනි CCTV කැමරා සවිකිරීමේදී, අත්අඩංගුවට ගත් පුද්ගලයෙකුගේ හෝ රැඳවියෙකුගේ පෞද්ගලිකත්වය ඇති අයිතිය සහ ඔවුන්ගේ නීතිඥවරයා හෝ වෛද්‍ය වෘත්තිකයා සමඟ රහසිගතව සන්නිවේදනය කිරීමට ඇති අයිතියට ගරු කළ යුතු ය.